Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අකුරණ ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම (සීමිත)

අකුරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට දැනටමත් අදළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අකුරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වූ රියදුරු තනතුර සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් පොදු සුදුසුකම්වලින් සමන්විත අයවලුන් විය යුතුයි.

02. වැටුප් ක්‍රමය : PL 3 - 2016
රු. 25,790- 10×270 - 10×300 - 10×330 -12×350 - රු. 38,990/-

2.1 *බඳවා ගැනීමේ ක්‍රමය* : කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

2.1.2 වෘත්තීය පරීක්ෂණය :

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/ යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තිය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

2.2 *සුදුසුකම්* :

I. *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් ව තිබිය යුතුය.

II. *වෘත්තීය සුදුසුකම් :*

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ලොරි/ට්‍රැක්ටර් රථ රියදුරු තනතුර සඳහා අදළ වන බාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32කට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යාහැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද A වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව B පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ රියදුරු තනතුර සඳහා අදළ වන බාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. පෞද්ගලික කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරනලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද C හා C1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව B පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

III. පළපුරුද්ද

මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

2.3 *කායික සුදුසුකම් :*

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

2.4 *වෙනත් :*

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

III. මාර්ග නීති හා මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.5 *වයස* :

I. අවම සීමාව අවුරුදු 18යි

II. අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

(iv) ඉහත සඳහන් තනතුරුවලට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

කායික මානසික යෝග්‍යතාවය හා අධ්‍යාපන වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබා ගත යුතුය.

05. *ඉල්ලුම්පත් එවිය යුතු පිළිවෙල :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2018.11.23 වැනි දිනට පෙර "ලේකම්, අකුරණ ප්‍රාදේශීය සභාව, අලවතුගොඩ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

06. *සහතික පිටපත් :*

අයදුම්පත් සමග සත්‍ය පිටපත් බවට අයදුම්කරු විසින්ම සහතික කර පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ);
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එකක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය;
(v) පළපුරුද්ද සනාථ කෙරෙන ලිපි;
(vi) රියදුරු තනතුර සඳහා අයදුම්කරන්නන් රියදුරු බලපත්‍රයේ පිටපත;
(vii) ජාතික හැඳුනුම්පතේ පිටපත.

07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

08. යම් අයදුම්කරුවෙකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැනීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම, එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

09. දැනටමත් සේවයේ නියුතු වූවන් ඔවුන් තම ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2018 ක් වූ නොවැම්බර් මස 02 වැනි දින,
අලවතුගොඩ,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

***අකුරණ ප්‍රාදේශීය සභාව ......................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමඟ නම :...........................................................

02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:...........................................................

03. ස්ථිර පදිංචි ලිපිනය:...........................................................

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:...........................................................

05. උපන් දිනය : අවුරුද්ද:..................... මාසය :..................... දිනය :.....................

06. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :..................... මාස :..................... දින:.....................

07. ස්ත්‍රී/ පුරුෂ භාවය:................................................

08. විවාහක/ අවිවාහක බව:...........................................................

09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග:...........................................................

10. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම්:...........................................................

11. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය ):...........................................................

අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :…………………

විභාග අංකය :…………………

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 05. | |
| 02. | | 06. | |
| 03. | | 07. | |
| 04. | | 08. | |

12. (i) වෙනත් සුදුසුකම් :…………………………………………
    (ii) වෘත්තීය සුදුසුකම් :…………………………………………
    (iii) සේවා පළපුරුද්ද :…………………………………………
    (මෙම සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය.)

13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ දැනට දරන තනතුර :…………………………………………
    ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග :…………………………………………
    එම තනතුරට පත් වූ දිනය :…………………………………………

14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:…………………………………………

15. රියදුරු තනතුර සඳහා අයදුම්කරුවන් පමණක් මෙම කොටස පිරවිය යුතුය :…………………………………………
    (i) රියදුරු බලපත්‍ර අංකය :…………………………………………
    (ii) බලපත්‍රය වලංගු වන දිනය:…………………………………………
    (iii) බලපත්‍ර පන්තිය :………………………………………… :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම භාරගනු ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

…………………………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………………

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම්කාරී/ ඉල්ලුම්කාරිය වන ………………………………………… මහතා/ මයා/ මෙනවිය මෙම ආයතනයේ ………………………… ක වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

…………………………………………
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :…………………………………………
තනතුර :…………………………………………
ආයතනය :…………………………………………
දිනය :…………………………………………